# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1790/14 - 2012 දෙසැම්බර් මස 26 වැනි බදාදා - 2012.12.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

22 "අ" වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 22"අ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය, මේ පනතේ සඳහන් කාර්යය සඳහා බලපත්‍රලත් කලාපයක් ලෙස මේ නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 දෙසැම්බර් මස 24 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ දී ය.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිවැව, මීගහජඹුර සහ ඉහලකුඹුක්වැව ග්‍රාමසේවා කොට්ඨාසවල සහ ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුගේගලයාය ග්‍රාමසේවා වසම ඒකාබද්ධවන ලෙස පිහිටි හෙක්ටයාර් අටසිය හතලිස් නවයයි දශම හයයි නවයයි එකයි හතක් (හෙක්. 849.6917) විශාල බිම් ප්‍රමාණයක පිහිටි ඉඩම් වලට හම්බන්තොට දිස්ත්‍රික්කයේ බලයලත් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කේ. ඩබ්. ඒ. විජේවර්ධන මහතා විසින් වර්ෂ 2012 ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින මැන සාදා සහතික කරන ලද අනුරේඛන අංක එච්/එස්ජී/එස්ආර්වයි/2012/434 දරන සිතියම ප්‍රකාරව එකී ඒකාබද්ධ ඉඩමට මායිම් :-

| | |
|---|---|
| උතුරට | - පහල මයිලගහවත්ත කැලෑව සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර ද ; |
| නැගෙනහිරට | - මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර, වාරිමාර්ග ඇල සහ පාර ද ; |
| දකුණට | - වාරිමාර්ග ඇල, පාර, දැනට පවතින වැට (Elephant Fence) සහ අළුතින් ඉදිකළ පාර ද ; සහ |
| බස්නාහිරට | - අළුතින් ඉදිකළ පාර සහ පහල මයිලගහවත්ත කැලෑව සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර ද. |

යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් අටසිය හතලිස් නමයයි දශම හයයි නමයයි එකයි හතයි (849.6917) විශාලත්වය ඇති ඉඩම වේ.

01 - 374